**ඩී.ජී.ඒ.උඩුගම එ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කඩවත්සතර හා ගඟවට කෝරළය**

**RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය) 185/2017 (2018.01.18 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය)**

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.**

**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර මිය
**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - ඩී.ජී.ඒ.උඩුගම මහතා
**නොතීසිලත්පාර්ශවය** - බී.එම්.පී.ජී.ජී.වී. බණ්ඩාර මයා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කඩවත්සතර හා ගඟවට කෝරළය.

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.07.03 |
| **තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.07.04 |
| **නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.07.06 |
| **නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.07.06 (ලැබුණු බව දැන්වීම),<br>2017.08.10 |
| RTIC **කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.08.16 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2017.07.03 දිනැති ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*මහනුවර මාවිල්මඩ බෝමළුව පාරේ අභියාචකගේ නිවස වෙත ඇති ප්‍රවේශ මාර්ගයේ චන්ද්‍රිකා මානපිටිය මහත්මියගේ උපදෙස් පරිදි ඉදිකරන ලද අනවසර තාප්පය පෙරලීම සඳහා අභියාචක විසින් කටයුතු කරන ලද බව දන්වා මාවිල්මඩ ග්‍රාම නිලධාරියා වෙත කරන ලද පැමිණිල්ලේ පිටපතක්*

තොරතුරු නිලධාරියා 2017.07.04 දිනැති ලිපියෙන් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(අ) වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව අභියාචක 2017.07.06 දිනැති අභියාචනය නම් කළ නිලධාරියා වෙත යොමු කර ඇත. නම් කළ නිලධාරියා 2017.08.10 දිනැති ලිපියෙන් අභියාචක විසින් විමසා ඇති තොරතුරු තෙවන පාර්ශවයකට අදාළව වන අතර තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 29 (2)(ඇ) වගන්තියට අනුව අදාළ තෙවන පාර්ශවය වන සී. මානපිටිය මහත්මිය තොරතුරු ප්‍රදානය කිරීමට තම ඇකැමැත්ත ලිඛිතව ප්‍රකාශ කර ඇති හෙයින් තොරතුරු අභියාචනය ප්‍රතික්ෂේප කර ඇත.
ඒඅනුව 2017.08.16 දින අභියාචක විසින් කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත.

**නියෝගය:**
මෙම අවස්ථාවේදී කරුණු සලකා බැලීමෙන් අනතුරුව අභියාචක විසින් 2017.07.03 තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා සිටිනු ලබන තොරතුරු, තොරතුරු නිලධාරියා සහ නම් කළ නිලධාරියා තීරණය කර ඇති පරිදි, තෙවන පාර්ශවයකට අයත් බැවින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(එ) වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කළ හැකි බව කොමිෂන් සභාව තීරණය කරන ලදී.

එමෙන්ම, පොදු අධිකාරිය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 29 (2)(ඇ) වගන්තියේ විධිවිධාන වලට යටත්ව 2017.08.01 වන දිනැති ලිපියෙන් තෙවන පාර්ශවයේ කැමැත්ත විමසා ඇති බවත් ඒඅනුව තෙවන පාර්ශවය විසින් විමසා සිටින තොරතුරු හෙළිදරව් කිරීම ලිඛිතව 2018.08.08 දිනැති ලිපියෙන් ප්‍රතික්ෂේප කර ඇති බවද කොමිෂන් සභාව සැළකිල්ලට ගනු ලැබීය.

තවද, විමසා සිටින තොරතුරු හෙළිදරව් වීමෙන් මහජන සුභසිද්ධියට අදාළ නොවන බවද කොමිෂන් සභාව වැඩි දුරටත් තීරණය කරන ලදී.

මේ අනුව නම් කළ නිලධාරීගේ තීරණය ස්ථිර කරමින් තොරතුරු අභියාචනය මෙලෙස අවසන් කරනු ලැබේ.

****